# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1945/7 - 2015 දෙසැම්බර් මස 14 වැනි සඳුදා - 2015.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 1/2012(II).

### 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

ඉන්දීය සාගර ටූනා කොමිෂන් සභාව මගින් ඇතිකරගත් ගිවිසුම් සම්බන්ධයෙන් කළමනාකරණ සහ සංරක්ෂණ පියවර ගැනීමේ කාර්යය සඳහා 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61(1)(ත) වැනි වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2015 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග විදේශීය ධජය සහිත ධීවර බෝට්ටුවල ධීවර කටයුතු සිදු කරනු ලබන ශ්‍රී ලාංකීක පුරවැසියන් සඳහා වන අවම ප්‍රමිති පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ, මහ මුහුදේ හෝ වෙනත් රාජ්‍යයක අනන්‍ය ආර්ථික කලාපය තුළ ධීවර මෙහෙයුම් සිදු කරනු ලබන විදේශීය ධජය සහිත ධීවර බෝට්ටුවක සේවය කිරීමට අපේක්ෂා කරනු ලබන ශ්‍රී ලංකාවේ යම් පුරවැසියෙකු :-

(i) වයස අවුරුදු 18ට අඩු නොවිය යුතු ය

(ii) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පතට අමතරව ඔහුගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පතක් ලබාගත යුතු ය.

(ii) අදාළ රාජ්‍යය විසින් පවත්වාගෙන යනු ලබන යාත්‍රා අධීක්ෂණ පද්ධති යටතේ නීති විරෝධී, වාර්තා නොවූ හා අවිධිමත් ධීවර කටයුතුවල යෙදුනු බවට සොයාගනු ලැබූ යම් තැනැත්තකු යටතේ සේවය නොයෙදිය යුතුය.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. කිසිදු රැකියා නියෝජිත ආයතනයක් හෝ ආයතනයක් විසින් අදාළ රාජ්‍යයේ යාත්‍රා අධීක්ෂණ පද්ධතිය යටතේ නීතිවිරෝධි, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතුවල නියැලුනු බවට සොයාගනු ලැබූ යම් සේවායෝජකයකු වෙනුවෙන් කිසිදු ශ්‍රී ලාංකික පුරවැසියෙකු සේවයේ නොයෙදවිය යුතු ය.

4. (i) විදේශීය ධජය සහිත ධීවර බෝට්ටුවක සේවය කිරීමට අපේක්ෂා කරනු ලබන යම් තැනැත්තකු, අවසර පත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය මෙහි I වන උපලේඛණයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව ඉදිරිපත් කළ යුතු ය.

(ii) මෙම නියෝගය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව විය යුතු ය.

5. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙහි 2 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් සම්පූර්ණ කිරීම මත පමණක් අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

6. අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක අධිකාරිය යටතේ හැර කිසිදු තැනැත්තකු විසින් විදේශීය ධජය සහිත ධීවර බෝට්ටුවක සේවය කිරීම නොකළ යුතු ය.

## I වැනි උපලේඛනය

[4(i) නියෝගය]

**ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, මාලිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකාව**

විදේශීය ධීවර බෝට්ටුවක සේවය කිරීමට ලබා දෙන අවසර පත්‍රය සඳහා වන ඉල්ලුම් පත්‍රය

| | | |
|---|---|---|
| සම්පූර්ණ නම | | ස්ථිර ලිපිනය |
| පදිංචි දිස්ත්‍රික්කය | | |
| ජා. හැ. ප. අංකය | | |
| විදේශ ගමන් බලපත්‍ර අංකය (ඇත්නම්) | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| උපන් දිනය | වර්ෂය | මාසය | දිනය | ඉල්ලුම් කරන දිනට වයස | වර්ෂය | මාසය | දිනය |
| | | | | | | | |

| | | | |
|---|---|---|---|
| දුරකථන අංකය | | ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ධීවර හැඳුනුම්පත් අංකය | |

| | | |
|---|---|---|
| රැකියාවේ වත්මන් ස්වභාවය | ප්‍රධානියා/නියමුවා | වත්මන් සේවායෝජකයාගේ විස්තර |
| | කාර්ය මණ්ඩල සාමාජික | නම සහ ලිපිනය |
| | මත්ස්‍ය සැකසුම්කරු/ අපනයනකරු | දුරකථන අංකය |

| | | |
|---|---|---|
| සේවා නියුක්තිය සඳහා පහසුකම් සලස්වනු ලබන නියෝජ්‍යායතනය/ආයතනය | | |
| නම | ලිපිනය | දුරකථන අංකය |

| | | | |
|---|---|---|---|
| ඉල්ලුම්කරනු ලබන රැකියාව පිළිබඳ පළපුරුද්ද | විදේශ රාජ්‍යය | | සේවා කාලසීමාව |
| | එම විදේශ රාජ්‍යයේ/රාජ්‍යයන්ගේ නම/නම් | | |
| | ශ්‍රී ලංකාව | | |
| ජාතික හෝ වෙනත් රාජ්‍යයක ධීවර නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වරදකරු කිරීම් පිළිබඳ වාර්තා | | | |

1. ඉල්ලුම් පත්‍රයේ ලබා දී ඇති ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

2. කිසිදු නීතිවිරෝධි, වාර්තා නොවූ හා අවිධිමත් ධීවර කටයුතුවල නොයෙදෙන බවට මා මෙයින් එකඟ වන අතර එම එකඟවීම තහවුරු කිරීම පිණිස වන දිවුරුම් පෙත්සමක් මෙයට අමුණා ඇත.

3. මෙහි සඳහන් කර ඇති තොරතුරු කිසිවක් වැරදි බවට පෙනී ගියහොත් ඒ තොරතුරු පදනම් කරගෙන නිකුත් කරන ලද මේ අවසරපත්‍රය අවලංගු කරනු ලැබීමට යටත් වන බවට මා මෙයින් එකඟ වෙමි.

..........................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :............................

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

(අ) විදේශීය ධීවර බෝට්ටුවක සේවය කිරීමට ලබාදෙන අවසරපත්‍රය නිකුත් කිරීම සඳහා නිර්දේශ කරම්/නොකරමි.

..........................................................................................................................................................................

| ..................... | .................................. | .......................................... | ............................. |
|---|---|---|---|
| අත්සන | ධීවර පරීක්ෂකගේ නම | ධීවර පරීක්ෂක කොට්ඨාසය | දිනය |

(ආ) විදේශීය ධීවර බෝට්ටුවක සේවය කිරීමට ලබාදෙන අවසර පත්‍රය නිකුත් කිරීම සඳහා නිර්දේශ කරම්/නොකරමි.

..........................................................................................................................................................................

| ..................... | .................................. | .......................................... | ............................. |
|---|---|---|---|
| අත්සන | සහකාර අධ්‍යක්ෂගේ නම | දිස්ත්‍රික්කය | දිනය |

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්/බලපත්‍ර දීමේ නිලධාරියාගේ නියෝගය

විදේශීය ධීවර බෝට්ටුවක සේවය කිරීමට ලබාදෙන අවසර පත්‍රය නිකුත් කිරීම සඳහා අනුමත කරමි/නොකරමි.

නම : .........................................

තනතුර : .........................................

මුද්‍රාව : .........................................

II වැනි උපලේඛනය

[4(ii) නියෝගය]

**ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, මාලිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකාව**

විදේශීය ධජය සහිත ධීවර බෝට්ටුවක සේවය කිරීමට ලබා දෙන අවසර පත්‍රය

ශ්‍රී ලංකාවේ ආගමන හා විගමන නීතිවලට සහ ශ්‍රී ලංකාව විසින් පිළිගෙන අත්සන් කරන ලද ජාත්‍යන්තර සම්මුති, ප්‍රඥප්ති හා යෝජනා සම්මතයන්වලට යටත්ව ..........................................................................................................................රටෙහි (වෙනත්) ..............................................ධීවර සමාගමට අයත් විදේශීය ධීවර බෝට්ටුවේ ප්‍රධානියා/නියමුවා/ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු / කම්කරුවෙකු වශයෙන් සේවය කිරීමට ජාතික හැඳුනුම්පත් අංක ...........................................................දරන සහ විදේශ ගමන් බලපත්‍ර අංක ........................................ දරන සහ........................ හි පදිංචි ..........................................................................................(නම) යන අයට අවසර ලබා දෙමි.

....................................
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

01-37

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.